# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1858/2 - 2014 අප්‍රේල් මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2014.04.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 8/2007 (II).

**2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත**

12 (1) වගන්තිය යටතේ නියමය

2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 12 (1) වගන්තිය මඟින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය අච්චිගේ දොන් සුසිල් ප්‍රේමජයන්ත වන මම, නැගෙනහිර පළාත් සභාවේ, තාක්ෂණය, පර්යේෂණ සහ පරමාණුක බලශක්ති, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු, වාර්මාර්ග හා ජල සම්පත් කළමනාකරණ සහ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා යන විෂය භාර අමාත්‍යවරුන් සහ පරිසර විෂයය පවරා ඇති අදාළ අමාත්‍යවරයා ද විමසා මෙහි උපලේඛනයෙහි නිශ්චිත ව සඳහන් බිම් ප්‍රමාණයන් ඉහත සඳහන් පනතේ කාර්යයන් සඳහා අම්පාර දිස්ත්‍රික්කයෙහි බලශක්ති සංවර්ධන ප්‍රදේශයන් ලෙස මෙම නියමය මඟින් ප්‍රකාශයට පත්කරමි.

2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 12 (1) වගන්තිය යටතේ සාදනු ලැබූ අම්පාර දිස්ත්‍රික්කයෙහි බලශක්ති සංවර්ධන ප්‍රදේශ දැක්වෙන 2008 පෙබරවාරි මස 26 වන දින, අංක 1538/22 දරන සහ 2009 දෙසැම්බර් මස 15 වන දින, අංක 1632/10 දරන අතිවිශේෂ ගැසට් පත්‍රවල පළකරන ලද නියමන් ඒ යටතේ නීත්‍යානුකූලව කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි, මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

අච්චිගේ දොන් සුසිල් ප්‍රේමජයන්ත
පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය.

2014 අප්‍රේල් මස 10 වැනි දින,
කොළඹ දී.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

එල්.ඩී.බී. 8/2007 (II)

**2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත**

12 (1) වගන්තිය යටතේ නියමය

2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනතේ 12 (1) වගන්තිය මඟින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය අච්චිගේ දොන් සුසිල් ප්‍රේමජයන්ත වන මම, නැගෙනහිර පළාත් සභාවේල තාක්ෂණය, පර්යේෂණ සහ පරමාණුක බලශක්ති, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු, වාර්මාර්ග හා ජල සම්පත් කළමනාකරණ සහ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා යන විෂය භාර අමාත්‍යවරුන් සහ පරිසර විෂයය පවරා ඇති අදාළ අමාත්‍යවරයා ද විමසා මෙහි උපලේඛනයෙහි නිශ්චිත ව සඳහන් බිම් ප්‍රමාණයන් ඉහත සඳහන් පනතේ කාර්යයන් සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙහි බලශක්ති සංවර්ධන ප්‍රදේශයන් ලෙස මෙම නියමය මඟින් ප්‍රකාශයට පත්කරමි.

අච්චිගේ දොන් සුසිල් ප්‍රේමජයන්ත
පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍ය.

2014 අප්‍රේල් මස 10 වැනි දින,
කොළඹ දී.

*උපලේඛනය*

*බලශක්ති සංවර්ධන ප්‍රදේශ - සුළං බලයල සූර්ය ශක්තිය සහ ජෛව ස්කන්ධ*

*ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය*

පහත I වැනි තීරයේ දැක්වෙන අයිතමයන්හි නිශ්චිතව සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පිහිටියා වූ ද එහි ෂෂ වැනි අනුරූපී තීරයෙහි නිශ්චිතව සඳහන් නියාමකයන්වලින් සීමා සලකුණු කොට තිබෙන්නා වූ ද, III වැනි අනුරූපී තීරයේ නිශ්චිතව සඳහන් වර්ග කිලෝ මීටර් ප්‍රමාණයකින් යුක්ත වූ ද මුළු ඉඩම් ප්‍රමාණය සහ එහි යම් ජලාශයක් පිහිටා ඇත්නම් එම ජලාශ ද සමග වේ.

| *අයිතම අංකය* | *I වැනි තීරය* | *II වැනි තීරය* | *III වැනි තීරය* |
|---|---|---|---|
| 1 | කුච්චවේලි | නැ 246044, උ 379524<br>නැ 249562, උ 383041<br>නැ 224202, උ 414641<br>නැ 220118, උ 412372 | 200.60 |
| 2 | මුත්තූර්<br>කින්නියා | නැ 238486, උ 359859<br>නැ 253830, උ 355637<br>නැ 255980, උ 360075<br>නැ 239443, උ 365137 | 84.81 |
| 3 | එච්චිලම්පන්නයි<br>සේරුවිල<br>මුත්තූර් | නැ 265538, උ 345812<br>නැ 268058, උ 346258<br>නැ 261584, උ 366828<br>නැ 259319, උ 365521 | 54.51 |
| 4 | එච්චිලම්පන්නයි | නැ 263949, උ 339733<br>නැ 269399, උ 339811<br>නැ 268231, උ 343548<br>නැ 263248, උ 343003 | 19.05 |

05 - 24/25

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.